සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## කුසලතා කැප්ස්ටෝනය - 2019 ජනවාරි

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

2019-02-02
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු වෙන් කිරීම:***

| කොටස | අවශ්‍යතාවය | ලකුණු |
|---|---|---|
| **A** | සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 40 |
| **B** | ප්‍රශ්න හයෙන් හතරකට පමණක් උත්තර සැපයිය යුතුය. | 60 |
| **මුළු ලකුණු** | | **100** |

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යය යොදා ගනිමින්****, ඔබ වෙත සපයනු ලබන* ***පොත්වල*** *උත්තර ලියන්න.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** "විමසුම්" (Queries), "වාර්තා" (Reports) සහ "ආකෘති" (Forms) යන ලක්ෂණයන් (features) හමුවන්නේ පහත සඳහන් කුමන යෙදවුම් මෘදුකාංග වර්ගයෙහි ද?

(1) පද සකසනය (Word Processor).

(2) ඉදිරිපත් කිරීමේ කළමනාකරු (Presentation Manager).

(3) දත්ත පදනම් කළමනාකරණ පද්ධතිය (Database Management System).

(4) පැතුරුම්පත් මෘදුකාංගය (Spreadsheet Software).

**1.2** DOCX ගොනු දිගුව (file extension) සම්බන්ධිත වන්නේ පහත සඳහන් කුමන යෙදවුම් මෘදුකාංග වර්ගය සමඟ ද?

(1) පද සකසනය (Word Processor).

(2) ඉදිරිපත් කිරීමේ කළමනාකරු (Presentation Manager).

(3) දත්ත පදනම් කළමනාකරණ පද්ධතිය (Database Management System).

(4) පැතුරුම්පත් මෘදුකාංගය (Spreadsheet Software).

1.3 ගෙවීම් උපලේඛණයක සඳහන් දිනයන් සමඟ අනුරූපී වන මුදල් ප්‍රවාහ මාලාවක්, ගිණුම් විධායකයෙකු සතුව තිබේ. අනුරූපී දිනයන් ආවර්ථ (periodic) නොවේ නම්, ඉහත කී මුදල් ගැලීම් උපලේඛණයේ ඇතුලත් මුදල් ප්‍රවාහ සඳහා අභ්‍යන්තර ඵලදා අනුපාතිකය (internal rate of return) ගණනය කිරීම සඳහා ඔහු / ඇය විසින් මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි පවතින, පහත සඳහන් ඒවා අතුරෙන්, කුමන ශ්‍රිතය (function) භාවිත කළ යුතුද?

(1) IRR (2) XIRR (3) PMT (4) PPMT

1.4 දකුණු පසින් පෙන්වා ඇති රූපය, පුවත්පත්වල සහ ප්‍රවර්ධන පත්‍රිකාවල ජනප්‍රියව පවතින සංකේතයකි (symbol). එබඳු සංකේත හැඳින්වීම සඳහා පහත සඳහන් පද (terms) අතුරෙන් භාවිත කළ හැක්කේ කුමක් ද?

(1) MICR Code (2) QR Code (3) Binary Code (4) RFID

1.5 ගිණුම් විධායකයෙකු විසින් එක් එක් ස්ලයිඩයට (slide) සටහන් (notes) ඇතුලත් කර තිබෙන, මයික්‍රොසොෆ්ට් පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමක් පිළියෙල කර තිබේ. ලැප්ටොප් පරිගණකයක් (laptop computer) සහ බහුමාධ්‍ය පොජෙක්ටරයක් (multimedia projector) භාවිත කරමින් එය ඉදිරිපත් කිරීමට, ඔහුට / ඇයට අදාල සටහන් බැලීමට අවශ්‍ය නම්, පවර්පොයින්ට්වල ඇතුලත් පහත සඳහන් කුමන අංගය ඔහුට ප්‍රයෝජනවත් වේ ද?

(1) Rehearse Timing. (2) Read Narration.

(3) Present Online. (4) Presenter View.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, වර්තමානයේ භාවිත කෙරෙන ජනප්‍රිය ERP මෘදුකාංගයක් වන්නේ කුමක් ද?

(1) Microsoft Project. (2) Microsoft Access.

(3) SAP. (4) Office 365.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි කපා හැරීම (Cut), පිටපත් කිරීම (Copy) හෝ ඇලවීම (Paste) සඳහා භාවිත කෙරෙන කෙටික්‍රමයක් (shortcut) **නොවන්නේ** කුමක් ද?

(1) CTRL + C. (2) CTRL + V. (3) CTRL + X. (4) CTRL + Z.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාව නියෝජනය කෙරෙන ඉහළම මට්ටමේ වෙබ් අඩවි වසම (Top Level Domain for websites) නියෝජනය කෙරෙන්නේ කුමකින් ද?

(1) .lk (2) .lanka (3) .sri (4) .srilanka

1.9 ශ්‍රී ලාංකික ගනුදෙනුකරුවෙකුට ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් විදේශ රටක වාණිජ බැංකුවකට අරමුදල් මාරු කිරීමට අවශ්‍ය වූ විට, පහත සඳහන් සේවා අතුරෙන්, කුමක් භාවිත කළ හැකිද?

(1) Common Electronic Fund Transfer Switch (CEFTS).

(2) Society for Worldwide Interbank Financial Telecommunication (SWIFT).

(3) Traveler's Cheques.

(4) Credit Cards.

**1.10** "BitCoin" යනුවෙන් හැඳින්වෙන්නේ:

(1) ශ්‍රී ලංකාවේ බැංකු අතර විද්‍යුත් ක්‍රමයට අරමුදල් මාරුකිරීම සඳහා යොදාගන්නා ක්‍රමයේ නමකි.

(2) තනිකරම මාර්ගගත වෙබ් අඩවිවල භාවිත කෙරෙන ණයපතක නමකි.

(3) මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි මුදල් වර්ග (currencies) ගබඩා කිරීමට භාවිත කෙරෙන දත්ත ආකෘතියේ නමකි.

(4) අන්තර්ජාලයේ භාවිත කෙරෙන විද්‍යුත් (සංඛ්‍යාංක) මුදල් වර්ගයේ නමකි.

*අංක 1.11 සිට 1.16 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම සුදුසු වචනය වරහන් තුළ දී ඇති වචන අතුරෙන් තෝරන්න. තෝරාගත් වචනය, අදාල ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න:*

**1.11** කලින් නිර්වචිත අරමුණු සඳහා (pre-defined objectives) ගණනය කිරීම් ඉටුකර ගැනීමට පරිශීලකයන් හට හැකියාව ලබාදීමට මයික්‍රොසොෆ්ට් එක්සෙල් හි …………………….. *(Functions / Formulas)* ගොඩනැගී (in-built) ඇත.

**1.12** මයික්‍රොසොෆ්ට් එක්සෙල්හි වැඩ පත්‍රිකා කෝෂ (cells), …………………….. *(ROW + COLUMN / COLUMN + ROW)* අනුපිළිවෙල භාවිතයෙන් හඳුනාගනු ලබයි.

**1.13** සම්බන්ධිත දත්ත පදනම් කළමනාකරණ පද්ධතියක (relational database management system), …………………….. *[වගු (Tables) / ගොනු (Files) ]* එකක් හෝ වැඩි ගණනක් දත්ත පදනමක තිබේ.

**1.14** MS Word හි ක්‍රියාවන් නැවත සිදුකිරීමට අපට අවශ්‍ය වන්නේ නම්, …………………….. *(Voice Recognition / Macros)* භාවිත කරමින් අපට උපදෙස් පටිගත (record) කළ හැකිය.

**1.15** මයික්‍රොසොෆ්ට් ඇක්සස් (Microsoft Access) හි විමසුම් (Queries) …………………….. *(SQL / HTML)* භාවිත කරමින් ලිවිය හැකිය.

**1.16** ජාල පිටු ප්‍රවේශනයේදී (accessing web pages), …………………….. *(HTTP / VOIP)* නියමාවලිය (protocol) බොහෝ විට භාවිත කරනු ලැබේ.

*අංක 1.17 සිට 1.20 දක්වා පහත දී ඇති එක් එක් ප්‍රකාශය, **සත්‍ය** ද, **අසත්‍ය** ද යන්න සඳහන් කරන්න. ඔබේ උත්තරය (සත්‍ය හෝ අසත්‍ය යන්න), අදාල ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන්න.*

**1.17** විද්‍යුත් තැපැල් (email) ලිපිනයක "@" සළකුණු දෙකක් තිබිය හැකිය.

**1.18** භෞතික පාලනයන්, තාක්ෂණික පාලනයන් සහ පරිපාලන පාලනයන් ලෙස තොරතුරු ආරක්ෂණ පාලනයන්, වර්ග කළ හැකිය.

**1.19** පරිගණකයේ පවර්පොයින්ට් (PowerPoint) ස්ථාපනය කර තිබේ නම්, වින්ඩෝස් එක්ස්ප්ලෝරර් (Windows Explorer) දෙවරක් ක්ෂණිකව ඔබා අත්හළ විට (double clicked) පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමේ ගොනුවක් ස්වයංක්‍රියව ක්‍රියාත්මක වනු ඇත.

**1.20** ඔබ භාවිත කරමින් තිබූ ජංගම දුරකතනය විකිණීමට පෙර, පුද්ගලික දත්ත ඉවත් කිරීම සඳහා දුරකතනය ෆැක්ටරි රී-සෙට් (factory reset) කිරීමට උපදෙස් දෙනු ලැබේ.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

# B කොටස

ප්‍රශ්න හතරකට (04) පමණක් උත්තර සැපයිය යුතුය.

(මුළු ලකුණු 60)

## 02 වන ප්‍රශ්නය

වෘත්තිය අධ්‍යාපන ආයතනයක දත්ත පදනමකින් උපුටාගත් ශිෂ්‍ය ලැයිස්තුවක් පහතින් නිරූපණය කර ඇත:

| ශිෂ්‍ය අංකය | පෙළපත් නාමය | මුල් නම | ජාතික හැඳුනුම්පත් අංකය | ලියාපදිංචි වූ දිනය | සමත් වූ විභාග මට්ටම් | මේ දක්වා ගෙවූ ලියාපදිංචි සහ අලුත් කිරීමේ ගාස්තු (රු.) | දිස්ත්‍රික්කය | ක්‍රියාකාරී ශිෂ්‍ය තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| 1001 | අමරසිරි | ශජ්රිකා | 931401235V | 2018-05-10 | 1 | 2,000.00 | කොළඹ | Y |
| 1002 | පින්සිරි | ශයානි | 858152400V | 2017-06-01 | 3 | 7,000.00 | මහනුවර | Y |
| 1003 | දේවනායගම් | තිරු | 920510400V | 2017-05-01 | 1 | 6,000.00 | යාපනය | Y |
| 1004 | සෙල්වේන්ද්‍රන් | සෙල්වි | 918210450V | 2017-08-01 | 2 | 2,000.00 | නුවරඑළිය | N |
| 1005 | සිල්වා | ඩේමියන් | 902371588V | 2017-06-01 | 2 | 3,000.00 | ගාල්ල | N |
| 1006 | විජේසිරි | කුමාර | 931812566V | 2016-06-01 | 2 | 9,000.00 | මාතර | Y |
| 1007 | සාහිර් | හුස්නි | 933551789V | 2017-06-01 | 1 | 6,000.00 | කොළඹ | Y |
| 1008 | අබේපාල | සමන් | 900540370V | 2017-09-01 | 1 | 5,000.00 | ත්‍රිකුණාමලය | Y |

**සටහන්**:

- විභාග මට්ටම් 1, 2 හෝ 3 වේ.
- ක්‍රියාකාරී ශිෂ්‍යයන් යනු ලියාපදිංචිය සඳහා මේ දක්වා හිඟ ගාස්තු කිසිවක් ගෙවීමට නොමැති සහ අලුත් කිරීමේ ගාස්තු මේ දක්වා ගෙවා ඇති ශිෂ්‍යයන්ය.

ඉහත දත්ත පමණක් තිබේයැයි සලකා, පහත සඳහන් ප්‍රශ්නවලට උත්තර ලියන්න.

(a) පහත සඳහන් එක් එක් ක්ෂේත්‍රය සඳහා වඩාත්ම සුදුසු දත්ත වර්ගය **හඳුනා දක්වන්න**:

| ක්ෂේත්‍රයේ නම | දත්ත වර්ගය |
|---|---|
| ශිෂ්‍ය අංකය | |
| පෙළපත් නාමය | |
| ජාතික හැඳුනුම්පත් අංකය | |
| ලියාපදිංචි වූ දිනය | |
| සමත් වූ විභාග මට්ටම් | |
| මේ දක්වා ගෙවූ ලියාපදිංචි සහ අලුත් කිරීමේ ගාස්තු | |
| දිස්ත්‍රික්කය | |
| ක්‍රියාකාරී ශිෂ්‍ය තත්ත්වය | |

(ලකුණු 08)

(b) ඉහත ක්ෂේත්‍ර අතුරෙන්, අපට ලුක්අප් ෆීල්ඩ්ස් (lookup fields) භාවිත කළ හැකි සුදුසු ක්ෂේත්‍රයක් **හඳුනා දක්වන්න.**

(ලකුණු 02)

(c) ක්‍රියාකාරී නොවන ශිෂ්‍යයන් විසින් ගෙවා ඇති සම්පූර්ණ ලියාපදිංචි ගාස්තු ප්‍රමාණය, දිස්ත්‍රික්ක මට්ටමින්, සොයා ගැනීමට ආයතනයට අවශ්‍යව ඇත. මයික්‍රොසොෆ්ට් ඇක්සෙස් (Microsoft Access) භාවිත කරමින් මෙම තොරතුරු ලබාගත හැක්කේ කෙසේදැයි **පැහැදිලි කරන්න**.

*(මෙම ගණනය කිරීම සඳහා අවශ්‍යකරන නිශ්චිත ක්ෂේත්‍ර සහ පිහිටුවීමට අවශ්‍ය කොන්දේසි / පසුබිම ඔබේ උත්තරයේ හඳුනා දැක්විය යුතුය.)*

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

## 03 වන ප්‍රශ්නය

මයික්‍රොසොෆ්ට් එක්සෙල් (Microsoft Excel) හි භාවිත කෙරෙන පහත සඳහන් එක් එක් ශ්‍රිතයෙන් ඉටුකෙරෙන අරමුණ **පැහැදිලි කරන්න**:

(a) NOW

(b) PV

(c) AND

(d) HYPERLINK

(e) NPV (එකකට ලකුණු 03 බැගින්, මුළු ලකුණු 15)

## 04 වන ප්‍රශ්නය

(a) විද්‍යුත් තැපැලේ (e-mail) ඇති පහත දැක්වෙන අංගයන්ගෙන් (features) ඉටු කෙරෙන අරමුණ **පැහැදිලි කරන්න**:

(i) Forward

(ii) Signature

(iii) Spam Folder / Spam Mail (ලකුණු 06)

(b) විද්‍යුත් තැපැලක් (e-mail) යැවීමේදී ඇති පහත සඳහන් අංග (features) අතර **අසමානතා බලන්න (contrast)**:

(i) CC vs BCC

(ii) Reply vs Reply to All (ලකුණු 06)

(c) "විද්‍යුත් තැපැලක් යවන විට, අපට ඕනෑම වර්ගයක ගොනුවක් (file) සහ ඕනෑම ප්‍රමාණයේ (size) ගොනුවක් අමුණා (attach) යැවිය හැකිය."

මෙම ප්‍රකාශනය සමඟ ඔබ එකඟ වන්නේදැයි **සඳහන් කරන්න**. ඔබේ උත්තරය සාධාරණීකරණය කරන්න.

(ලකුණු 03)
(මුළු ලකුණු 15)

## 05 වන ප්‍රශ්නය

(a) ව්‍යාපාර සංවිධානයක් සඳහා අන්තර්ජාලය භාවිත කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) සම්ප්‍රදායික බැංකුකරණ මෙහෙයුම් හා සැසඳීමේදී, අන්තර්ජාල (internet) බැංකුකරණය හෝ ජංගම (mobile) බැංකුකරණය භාවිත කිරීමේ වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) ඔබේ මිතුරා / මිතුරියට ඔහුගේ / ඇයගේ අන්තර්ජාල බැංකුකරණ මුරපදය (password) අමතක වී තිබේ.

ඔබේ මිතුරා / මිතුරියට ගිණුමට ප්‍රවේශනය (access) වීම සඳහා යළි හැකියාව (re-enable) සලස්වාදීමට ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු මගින් දැනට අනුගමනය කරනු ලබන පටිපාටි (procedures) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(d) ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ [Enterprise Resourse Planning (ERP)] මෘදුකාංගයක් මගින් සංවිධානයකට ලබාගත හැකි වටිනාකම් එකතු (value additions) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 15)

## 06 වන ප්‍රශ්නය

(a) මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි තිබෙන පහත සඳහන් අංගයන්ගෙන් ඉටු කරනු ලබන කාර්යයන් (tasks) **පැහැදිලි කරන්න**:

- (i) Page Orientation
- (ii) Format Painter
- (iii) Show / Hide
- (iv) AutoText
- (v) Print Preview

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 10)

(b) ලිපිගොනු සංයුක්තිය (mail merge) යනු මයික්‍රොසොෆ්ට් වර්ඩ් (Microsoft Word) හි තිබෙන ඉතාමත් ප්‍රයෝජනවත් අංගයන්ගෙන් එකකි. එය ප්‍රයෝජනවත් වන්නේ කුමන අවස්ථාවන්හිදීදැයි **පැහැදිලි කර**, ලිපිගොනු සංයුක්ත ක්‍රියාවලිය (mail merge process) සම්පූර්ණවීම සඳහා අවශ්‍ය පියවරයන් **ලැයිස්තුගත කරන්න**.


(ලකුණු 05)


(මුළු ලකුණු 15)

## 07 වන ප්‍රශ්නය

ජනප්‍රිය සුපිරි වෙළෙඳසැලක වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ශිෂ්‍යයෙකු විසින් ඉදිරිපත් කිරීමක් (presentation) නිර්මාණය කර තිබේ. එම ඉදිරිපත් කිරීමෙන් උපුටාගත් අංක 1 - 6 දක්වා ලකුණු කළ ස්ලයිඩ, පහතින් දක්වා ඇත:










3

Revenue: 2018

| Category | Q1 (Rs. Mln) | Q2 (Rs. Mln) | Q3 (Rs. Mln) |
|---|---|---|---|
| Beverages | 510 | 600 | 620 |
| Bakery | 400 | 425 | 500 |
| Canned Goods | 300 | 200 | 100 |
| Dairy | 150 | 170 | 200 |
| Frozen Foods | 800 | 820 | 850 |
| Fish and Meat | 500 | 400 | 400 |
| Produce | 400 | 300 | 350 |
| Personal Care | 350 | 250 | 250 |
| Other | 850 | 750 | 650 |
| Total | 4260 | 3915 | 3920 |






2016 පවර්පොයින්ට් (PowerPoint 2016) භාවිත කරමින් ඉහත සඳහන් ස්ලයිඩ්ස් (slides) හය ප්‍රතිනිර්මාණය (recreate) කිරීමට ඔබට සිදුවී ඇතැයි උපකල්පනය කරන්න. පහත (a) සිට (g) දක්වා හඳුනා දක්වා ඇති කාර්යයන් සම්පූර්ණ කිරීමට ඔබ විසින් භාවිත කරනු ලබන අංගයන් **පැහැදිලි කරන්න**. මෙම කාර්යය සඳහා භාවිතකරනු ලබන පරිගණකයේ දෘඪ ඩිස්කය (hard disk) තුළ මෙහි දකුණු පසින් පෙන්වා ඇති පිළිබිඹු ගොනුව (image file) [අත් කරත්ත සළකුණ (cart symbol)] තිබෙන බව ද, හිස් (blank) ස්ලයිඩර් හයක් සමඟ පවර්පොයින්ට් විනිවිදක සංදර්ශනයක් (powerpoint slideshow) ඔබ වෙත සපයා ඇති බව ද උපකල්පනය කරන්න:



*(අකුරු ප්‍රමාණය, පාට හෝ අකුරු මුහුණත වෙනස්කම් ඔබ විසින් සඳහන් කිරීම අවශ්‍ය **නොවේ**).*

(a) Annual Report 2018 හි ශීර්ෂ පාඨ ස්ලයිඩයේ (heading slide) පෙන්වා ඇති පරිදි, අත් කරත්ත සලකුණ (cart symbol) එකතු කරන්න. (ලකුණු 02)

(b) ඉදිරිපත් කිරීම (presentation) ධාවනය (running) වෙමින් පවතිද්දී, ඉදිරිපත් කරන්නා විසින් අංක **1** ස්ලයිඩයෙහි අත්කරත්ත ලකුණ ක්ලික් කරනවාත් සමගම, ඉදිරිපත් කිරීම සෘජුවම අංක **6** ස්ලයිඩයට මාරුවන බවට සහතික කරන්න. (ලකුණු 03)

(c) Store Locations ස්ලයිඩයේ ඇතුලත් සටහන් ලැයිස්තුව සඳහා අත්කරත්ත ලකුණ ස්වයංක්‍රියව පෙන්නුම්කරන ආකාරයට අත්කරත්ත ලකුණ එකතු කරන්න. අංක **2** ස්ලයිඩයේ පාඨ දැනටමත් එහි ඇතැයි ඔබට උපකල්පනය කළ හැකිය. (ලකුණු 02)

(d) Revenue 2018 ස්ලයිඩයේ පෙන්වන ආකාරයට revenue තොරතුරු එකතු කරන්න.

*[සටහන : මයික්‍රොසොෆ්ට් එක්සෙල් වැඩ පොතක (Microsoft Excel Workbook) අදාල දත්ත තිබෙන බව ඔබට උපකල්පනය කළ හැකිය.]* (ලකුණු 02)

(e) අංක **4** ස්ලයිඩයේ ප්‍රදර්ශනය කර ඇති ආකාරයට ප්‍රස්තාරයක් (chart) ප්‍රදර්ශනය කරන්න.

*[සටහන : ඉහත (d) උප ප්‍රශ්නයේ භාවිත කළ මයික්‍රොසොෆ්ට් එක්සෙල් වැඩ පොතෙහි අදාල දත්ත තිබෙන බව ඔබට උපකල්පනය කළ හැකිය.]* (ලකුණු 02)

(f) අංක **5** ස්ලයිඩයේ ප්‍රදර්ශනය කර ඇති ආකාරයට ප්‍රස්තාරයක් (chart) ප්‍රදර්ශනය කරන්න.

*[සටහන : මයික්‍රොසොෆ්ට් වර්ඩ් ලේඛණයක (Microsoft Word Document) අදාල දත්ත තිබෙන බව ඔබට උපකල්පනය කළ හැකිය.]* (ලකුණු 02)

(g) අංක **6** ශීර්ෂපාඨ ස්ලයිඩයේ "Short Term Plans" යන ශීර්ෂ පාඨය ප්‍රදර්ශනය කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 15)

*B කොටසෙහි අවසානය*